# The Gospel of Luke and the Dignity of Women:

# Guiding Principles from the Gospel of Luke in Promoting the Dignity of Women in the Apparel Industry of Sri Lanka


Sanduni Mahesha Samarasinghe

Lecturer-Christian Culture

Faculty of Humanities and Social Sciences, Department of Humanities, Aquinas College of Higher studies - Colombo-08

Sadunim7@gmail.com



**ABSTRACT**

This research seeks to demonstrate that the illumination from the Gospel of Luke can be utilized to promote the dignity of the women workers in today's garment industry in Sri Lanka. The foundation of investment Zones became a prominent economic development policy of Sri Lanka in 1977. In addition to these investment zones, garment factories were opened at the divisional level, where small and medium-scale garment factories were founded in various Divisional Secretariats throughout the island. Such institutions are also common in the Katana Divisional Secretariat. Women from Katana Divisional Secretariat and the other rural areas continue to be attracted to be employed in these institutions in large numbers. The main objective of this study is to examine how the Lucan theology of women could be an inspiration to promote the dignity that present-day female workers in the garment industry of Sri Lanka. For the purpose of this study, a sample of Forty (40) female workers employed in the garment factories in Katana Divisional Secretariat was selected under the random sampling method. Preliminary data and information were obtained from this sample by using questionnaires, conducting interviews, case studies and observation methods. The data and information thus obtained were then analyzed and presented by utilizing descriptive statistical tools. Hence, this study endeavors to explore the manner in which Jesus' efforts as a true humanitarian noble leader as presented by Luke in his Gospel to reform the religious, political, social and cultural structures of contemporary Jewish society could be used as a yard stick to promote and secure the dignity of women workers in the garment industry of Sri Lanka.



**Keywords**: Development Policy, Garment Factories, Women Workers, Dignity, Gospel of Luke

# ඇඟලුම් ක්ෂේත්‍රයේ නියුතු කාන්තාවන්ගේ උදාරත්වය ප්‍රවර්ධනය සඳහා කිතුනු ලූක් සුබාරංචි චින්තනයේ ආලෝකය

## හැඳින්වීම

'උදාරත්වය' යන්න විවිධ නිර්වචන ඇසුරින් අර්ථකථනය කළ හැකිය. සැකෙවින් දක්වතොත් උදාරත්වය යනු පුද්ගලයෙකු සතු ගෞරවනීයභාවයයි; අභිමානයයි; වැදගත්කමයි; මිනිසා සතු සමාජීය වටිනාකමයි (ඔක්ස්ෆර්ඩ්, 423). බටහිර සමාජ චින්තනය අනුව 'කාන්තා උදාරත්වය' යනු නිදහස, ස්වාධීනත්වය, ඓතිවාසිකම් හිමිවීම, සමානාත්මතාව හා සමාජ පිළිගැනීම ආදී මෙලොව මනුෂ්‍යයෙකු වශයෙන් උපත ලත් සියලුම මිනිසුන්ට උරුම විය යුතු උතුම් මානුෂීය ගුණාංගයන්ට හිමිකම් කීමේ හැකියාව සහතික කළ හැකි පසුබිමක් කාන්තාවන්ට නිර්මාණය වීමයි.

'බලවතා විසින් දුබලයා පෙළීම' අතීතයේ සිට වර්තමානය දක්වාම සුලබව දක්නට ලැබෙන පොදු යථාර්ථයකි (විජේසිංහ, 81). මෙම බලවතා පුරුෂයෙකු වූ කල්හි ඔහු කාන්තාව පීඩාවට පත් කරන අතර ස්වාමියෙකු වූ කල්හි ඔහු සිය දාස-දාසීන් පීඩාවට පත් කරයි. වර්තමානයේ 'මුදල' පදනම් කරගනිමින් ධනවත්-දිළිඳු, ස්වාමි-සේවක පරතර මෙන්ම මුදලට වහල් වීම, මුදලට විකිණීම ආදියද සිදුවේ. ශ්‍රමය හා බැඳි ක්ෂේත්‍රයන්හි සිදුවන්නා වූ ශ්‍රම සූරාකෑමෙන් බොහෝවිට ස්වාමිවරුන් විසින් ශ්‍රමිකයෝ පෙළනු ලබති. එක් පුද්ගලයෙකු තවත් පුද්ගලයෙකුගේ අයිතීන් තමා සතු කරගැනීම හා නිදහස උදුරා ගැනීම මානව ඉතිහාසයේ ආරම්භයේ සිටම සිදුවූවකි (ජයසේන, 9). මෙසේ මිනිසෙකු විසින් තවත් මිනිසෙකුගේ අයිතීන් සීමා කරනු ලැබීම බටහිර චින්තනය අනුව මානව හිමිකම් උල්ලංඝනය කිරීමකි; බයිබලීය පසුබිම අනුව එය තම මානව වගකීමෙන් බැහැරව යාමකි (පීරිස්, 52-53)[1].

මිනිස් ශ්‍රමය කිතුනු ජීවිත පැවැත්මට උපකාර කරගැන්ම කිතුනු දැක්ම වූවත්, වර්තමානයේ එම අභිමතයට පිටුපා යමින් මිනිස් ශ්‍රමය බහුල වශයෙන් සූරාකෑමට ලක්වේ (විජේතුංග, 209). තම පෞද්ගලික ලාභ අපේක්ෂාවෙන් ආයතන තුළ ක්‍රියාත්මක ව්‍යුහගත හිංසනය නිසා සහභාගීත්වයේ හා සමානාත්මතාවේ මානව ව්‍යුහ දෙදරා ගොස් මිනිස් ගරුත්වය පළුදු වී ඇත. මිනිසා සතු හැකියාවන් විවිධය; විෂමය. එම විෂම හැකියාවන් තුළින් දෙවිඳුන් අපේක්ෂා කළේ වැඩි හැකියාවන්ගෙන් යුතු පුද්ගලයන් හැකියා නොලද හෝ අඩු හැකියාවන්ගෙන් යුතු පුද්ගලයන්ට සේවය කිරීමයි. එහෙත් නූතනයේ සිදුවී ඇත්තේ වැඩි හැකියාවන් සහිත පුද්ගලයන් හැකියා නොමැති හෝ හැකියා අඩු පුද්ගලයන්ගේ සේවය අපේක්ෂා කිරීමයි (විජේසිංහ, 75). එම අපේක්ෂාවන් සාක්ෂාත් කරගැනීම සඳහා ඇතැම්හු අඩු හැකියා ඇති පුද්ගලයන්ගේ ශ්‍රමය මුදලේ අගයට හුවමාරු කරති. මිල-මුදල් හමුවේ

[1] තම අයිතිවාසිකම් වෙනුවෙන් සටන් කිරීමෙන් අනෙකාට හිරිහැරයක් වේ නම් සමගියකට ඇති ඉඩකඩ අල්ප ය. එමනිසා බයිබලීය ඉගැන්වීම වන්නේ මානව අයිතිවාසිකම් ඉස්මතු කිරීම වෙනුවට මානව වගකීම් ක්‍රියාත්මක කිරීමට ධාර්මික පසුතලයක් සපයා දෙමින් සමාජයීය යුතුකම් ඉටු කිරීමටත්, සමාජ සමගිය ඇති කිරීමටත් මග සලසා දීමයි.

තමන්ගේ ශ්‍රමය සූරාකන ස්වාමිවරුන්ටම ඔවුහු සේවය කරති. ඇතැමෙකු එසේ සේවය කරන්නේ තමාට අහිමි මානව උදාරත්වය පිළිබඳ සවිඥානික හැඟීමකිනි. එහෙත් ඇතැම්හු තමාගේ මානව උදාරත්වය පිළිබඳ අල්ප මාත්‍ර දැනුමක් හෝ නොමැති සේ අවිඥානිකව සිය ස්වාමිවරුන්ගේ සේවයට කැපවෙති.

අප ජීවත්වන සමාජයේ පවතින මෙම පොදු සමාජ යථාර්ථය හමුවේ මාගේ පර්යේෂණ ගැටලුව වන්නේ ශ්‍රී ලංකාවේ කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නිදහස් වෙළෙඳ කලාපයෙන් බැහැරව, ප්‍රාදේශීය ඇඟලුම් කර්මාන්තශාලාවන්හි කාන්තා ශ්‍රම බලකායට අයත් කාන්තා ශ්‍රමික අත්දැකීම් අධ්‍යයනය කරමින්, ඔවුන්ගේ වත්මන් වෘත්තිමය උදාරත්වය විග්‍රහ කිරීමයි. තවද එම අත්දැකීම් හමුවේ ලූක් සුබාරංචියෙන් නිරූපිත ජේසුතුමා තත්කාලීන ජුදා සමාජයේ කාන්තාවට හිමිව පැවති අඩු ගරුත්වයෙන් හෙබි ආගමික, දේශපාලනික, සමාජීය හා සංස්කෘතික ව්‍යුහ ප්‍රතිසංස්කරණය කිරීමෙහිලා ලබා දුන් ආලෝකය, වත්මන් ඇඟලුම් ක්ෂේත්‍රයේ නියුක්ත කාන්තා ශ්‍රමික ගැටලු නිරාකරණය සඳහා කෙතරම් දුරට අදාල කරගත හැකිද? යන්නයි. මන්දයත් වත්මන් සමාජ ගැටලු හමුවේ බයිබලීය සන්දර්භයෙන් විසඳුම් ඉදිරිපත් කිරීම කාලීන අවශ්‍යතාවක්ව පවතින බැවිනි.

වත්මන් ශ්‍රී ලංකාව සංවර්ධන ප්‍රතිපත්ති පසුපස විදුලි වේගයෙන් ඇදෙතත්, එම සංවර්ධන ප්‍රතිපත්ති හේතුවෙන් පැන නගින්නා වූ ජනතා අර්බුද විසඳාලීම සඳහා ක්‍රියාත්මක වන්නේ මන්දගාමී ස්වාභාවයකිනි. මෙවැනි සන්දර්භයක ජේසුතුමා, කාන්තාවන්ට උදාරත්වයක් හිමි කර දුන් අවස්ථා පිළිබඳ ප්‍රමුඛතාවක් දෙමින් රචිත ලූක් සුබාරංචියෙන් නිරූපිත එතුමාගේ ජීවන චරිතයේ ආලෝකය වත්මන් කාන්තා ශ්‍රමික ගැටලු සඳහා අදාළ කරගත හැකි සමාජ ව්‍යුහ අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණ ගැටලුවෙන් අපේක්ෂිත මුඛ්‍ය පරමාර්ථයයි. ඒ හැරුණුවිට කාන්තා උදාරත්වය පිළිබඳව ලූක් සුබාරංචියෙන් ඉදිරිපත් කරන්නා වූ දේවධාර්මික දැක්ම අධ්‍යයනය කිරීමත්, එම දේවධාර්මික දැක්ම වත්මන් සමාජ ගැටලු සඳහා අදාළ කරගත හැකි ආකාරය හඳුනා ගැනීමත්, ඇඟලුම් ක්ෂේත්‍රයේ නියුක්ත කාන්තා ශ්‍රමික අත්දැකීම් හඳුනා ගැනීමත්, එම ශ්‍රමික අත්දැකීම් අනුව ඔවුනට එම වෘත්තිය තුළ කාන්තා උදාරත්වයක් පවතින්නේද යන්න විමසා බැලීමත්, මෙම පර්යේෂණ ගැටලුවෙන් අපේක්ෂිත අනෙකුත් පර්යේෂණ අරමුණු අතර වේ.

'ඇඟලුම් ක්ෂේත්‍රයේ නියුතු කාන්තාවන්ගේ උදාරත්වය ප්‍රවර්ධනය සඳහා කිතුනු ලූක් සුබාරංචි චින්තනයේ ආලෝකය' යන පර්යේෂණ තේමාව ශාස්ත්‍රීය විෂය ක්ෂේත්‍රයට මෙන්ම ඇඟලුම් ක්ෂේත්‍රයේ නියුක්ත කාන්තාවන්ගේ වත්මන් ශ්‍රමික ගැටලු නිරාකරණයට ද ප්‍රායෝගිකව අදාළ කරගත හැකි කාලීන තේමාවකි. බයිබලීය පසුබිම තුළ කාන්තා උදාරත්වය ඉස්මතු වන අවස්ථා පැරණි ගිවිසුම හා නව ගිවිසුම් පසුබිම තුළ දක්නට ඇත. නව ගිවිසුම් පසුබිම තුළ ද විවිධ නව ගිවිසුම් ලේඛන මගින් එය සංවාදයට ලක් කළ හැකි වුවත් මෙම පර්යේෂණ තේමාව නව ගිවිසුම් පසුබිම් තුළ කාන්තා උදාරත්වය ගැඹුරින් ඉස්මතුව ඇති ලූක් සුබාරංචි චින්තනයට පමණක් සීමා වී ඇත. ජෙරුසලමේ සුබාරංචිය, ශුද්ධාත්මයාණන්ගේ සුබාරංචිය, යාච්ඤාවේ සුබාරංචිය, කාන්තාවන්ගේ සුබාරංචිය, දයාකරුණාවේ සුබාරංචිය හා පූර්ණ පරිත්‍යාගයේ සුවිශේෂය යනාදි වූ විවිධ තේමාවන්ගෙන් ලූක් සුබාරංචිය හඳුන්වනු ලබන්නේ එම විවිධ තේමාවන්ට ලූක් සුබාරංචි කතුවරයා දක්වා ඇති නැඹුරුතාව පාදක කරගෙනය (Derickx, 10). ඒ අනුව 'කාන්තාවන්ගේ සුබාරංචිය' යනුවෙන් ද හැඳින්වෙන ලූක් සුබාරංචියේ

අනෙකුත් සුබාරංචිවලට සාපේක්ෂව සුවිශේෂ නැඹුරුතාවකින් යුතුව කාන්තා උදාරත්වය ඉස්මතු කර දක්වයි.

ලූක් සුබාරංචියේ කාන්තා උදාරත්වය පිළිබඳ ඇති මෙම යොමුව වත්මන් සමාජ සන්දර්භයට අදාළ කරගැනීමේ දී කාන්තාවන්ගේ වෘත්තිමය උදාරත්වය නිර්ණය කළ හැකි බහුතර කාන්තා ශ්‍රමික ප්‍රජාවක් නියැලෙන ඇඟලුම් ක්ෂේත්‍රය තෝරා ගැනිණි. මෙම පර්යේෂණ තේමාවට අවැසි ශාස්ත්‍රීය ඥානය ගවේෂණය කිරීමේ දී ලූක් සුබාරංචියේ කාන්තා උදාරත්වය පිළිබිඹු වී ඇති බයිබලීය මූලාශ්‍රයයන් මෙන්ම ඇඟලුම් ක්ෂේත්‍රයේ නියුතු කාන්තාවන්ගේ සමාජ සන්දර්භය පිළිබඳ පවතින මූලාශ්‍රයයන් ද උපයෝගී කර ගැනිණි. ඒ ඇසුරින් ලූක් සුබාරංචියේ කාන්තා උදාරත්වය හා ඇඟලුම් ක්ෂේත්‍රයේ නියුතු කාන්තා ශ්‍රමික අත්දැකීම් තුලනාත්මකව අධ්‍යයනය කර නව පර්යේෂණ දැනුමක් අනාවරණය කරගත හැකි විය.

ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකායෙන් 35.9% කාන්තාවන් වන අතර ශ්‍රී ලංකාවේ දළ අපනයනය (Gross Export) හා විදේශ විනිමය (Foreign exchange) උපයා දෙන ප්‍රධාන නිෂ්පාදන ජාලයක් වන්නේ ඇඟලුම් ක්ෂේත්‍රයයි (2016 ජන හා සංඛ්‍යා ලේඛන වාර්තාව). ඇඟලුම් ක්ෂේත්‍රයේ රැකියා නියුක්තිකයන්ගෙන් 90% ක් පමණ කාන්තා ශ්‍රමිකයන්ය. නූතන ඇඟලුම් ක්ෂේත්‍රයේ ක්‍රියාකාරී වර්ධනය ක්‍රි.ව. 1950 දී පමණ ආරම්භ විය. ක්‍රි.ව. 1960 වනවිට විවිධ ඇඟලුම් නිෂ්පාදන කර්මාන්තශාලා 300ක් පමණ දේශීයව ආරම්භ කෙරිණි (දමයන්ති, 41). ක්‍රි.ව. 1970 වනවිට ඇඟලුම් ක්ෂේත්‍ර කර්මාන්තශාලා ශීඝ්‍ර වශයෙන් දේශීයව ව්‍යාප්ත විය ( Devanarayana, 7).

ක්‍රි.ව. 1977 රජය විසින් ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ප්‍රතිපත්ති අතර කොළඹ ආසන්න ප්‍රදේශයන්හි ආයෝජන සංවර්ධන කලාප පිහිටුවීමට ප්‍රමුඛතාවක් හිමිවිය. ඒ අනුව පළමු ආයෝජන සංවර්ධන කලාපය කොළඹට නුදුරින් කටුනායක දී ඇරඹිණි. ඉන්පසු මෙවැනි ආයෝජන කලාප පහක් 1982 රත්මලාන, 1989 බියගම, 1991 කොග්ගල, 1993 මිහින්තලේ, 1994 පල්ලෙකැලේ වැනි ස්ථාන කේන්ද්‍ර කරගනිමින් බිහිවිය. ඉන් අනතුරුව එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට එක් ඇඟලුම් කම්හලක් බැගින් කොට්ඨාස 200 ක කම්හල් පිහිටුවීමේ අරමුණින් 'කම්හල් 200 වැඩසටහන' ඔස්සේ ක්‍රියාත්මක කරන ලද කුඩා පරිමාණ ඇඟලුම් කර්මාන්තශාලා බිහිවිය (වැල්ලවත්ත, 172). කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ද නිදහස් වෙළෙඳ කලාපයෙන් පරිබාහිරව බිහිවූ ඇඟලුම් කර්මාන්තශාලා විශාල ප්‍රමාණයක් වර්තමානයේ පවතින අතර දේශීය මෙන්ම විදේශීය ආයෝජකයෝ මේවායේ ප්‍රාග්ධන හිමියන් හා කර්මාන්තශාලා ක්‍රියාධරයන් වශයෙන් කටයුතු කරති.

මෙම ප්‍රාදේශීය ඇඟලුම් කර්මාන්තශාලාවන්හි ශ්‍රමික ප්‍රජාවගේ අත්දැකීම් විවිධාකාර වූවත්, ඔවුන් අතර පවත්නා ගැටලු සියල්ල එකම රාමුවක් යටතේ වර්ගීකරණය කළ හැකිය. එනම් කායික, මානසික, සේවා ආයතන, සමාජ සහ-සම්බන්ධතා ආශ්‍රිත ගැටලු හා ආර්ථික ගැටලු යනාදී ලෙසය. පුරාණ ශ්‍රී ලංකාවේ කාන්තාවට හිමිව තිබූ ආගමික, සමාජීය, සංස්කෘතික හා දේශපාලන තත්ත්වය හා සසඳන කල්හි කාන්තාව සම්බන්ධව මෑත කාලීනව පවතින සමාජ ආකල්පයන්හි සාධනීය වෙනස්කම් කිහිපයක් සිදුවී ඇති බව පෙනෙයි (කුමාර, 37). එනමුදු කාන්තා ශ්‍රමික ප්‍රජාව අතර නොවිසඳුනු අර්බුද රාශියක් තවමත් පවතී. මෙම ප්‍රජාවගේ අර්බුද හා පීඩිත තත්ත්ව හමුවේ මොවුනට සුබසෙත සැලසීමේ

දී කම්කරු ප්‍රජාවගේ ස්වාමිවරුන් හා සමාජය අනුගමනය කළ යුතු පියවර කුමක්ද, ඔවුන් මේ සඳහා ප්‍රතිචාර දැක්විය යුත්තේ කෙසේද යන ප්‍රශ්න පැන නැගේ.

බයිබලයේ නව ගිවිසුම් පසුබිම තුළ ක්‍රිස්තුන් වහන්සේ සැබෑ මානව හිතවාදියෙකු හා සමාජ ප්‍රතිසංස්කරණවාදියෙකු වශයෙන් උන්වහන්සේ ජීවත් වූ තත්කාලීන ජුදා සමාජයේ පැවති සමාජ අසාධාරණකම් හා ජනතා ගැටලු හමුවේ සත්‍යය, සාධාරණය හා යුක්තිය වෙනුවෙන් පෙනී සිටි සේක. කාන්තාවට ද ගෞරවාන්විතව සැලකූ සේක. මන්දයත් එකල ග්‍රීක, රෝම හා හේබ්‍රව් සමාජයේ කාන්තාවට හිමි වූයේ පහත් තත්ත්වයකි (දිසානායක, 34). එතුමාගේ මෙම විප්ලවීය ක්‍රියා පිළිවෙත් එකල සමාජයේ මහත් ආන්දෝලනයකට තුඩු දුන්න ද තත්කාලීන සමාජයේ කාන්තාව පිළිබඳව පැවති නිෂේධාත්මක අදහස් අභිභවමින් ඔවුනට උදාරත්වයක් හිමි කර දීමට කටයුතු කළ ආකාරය ප්‍රශංසනීයයි.

## අධ්‍යයන ක්‍රමවේදය

මෙම පර්යේෂණය සඳහා කාන්තා ශ්‍රමිකයන් සතළිහකින් යුත් නියැදියක් අහඹු නියැදි ක්‍රමය (Systemetic Random Sample) යටතේ තෝරා ගැනිණි. විවාහක හා අවිවාහක කාන්තා අත්දැකීම් තරමක් වෙනස් විය හැකි නිසා විවාහක කාන්තාවන් විස්සක් හා අවිවාහක කාන්තාවන් විස්සක් වශයෙන් කාන්තා ශ්‍රමිකයන් සතළිහක් තෝරා ගැනිණි. එම නියැදිය සමග පෞද්ගලිකව මා විසින් සාකච්ජා කරමින් තොරතුරු ලබා ගත් අතර ඒ සඳහා ප්‍රශ්නාවලියක් උපයෝගී කරගන්නා ලදි.

එසේ ඇඟලුම් ක්ෂේත්‍රයේ කාන්තා ශ්‍රම උදාරත්වය නිර්ණය කිරීම සඳහා මූලික සාධක අටක් (මූලික තොරතුරු, සේවා තෘප්තිය, ආරක්ෂාව, ආර්ථික තත්ත්වය, ආයතනයේ ක්‍රියාත්මක වන සමිති සමාගම්, ශ්‍රමිකයන්ගේ කායික හා මානසික සෞඛ්‍යය, ඔවුන් නියැලෙන බාහිර ක්‍රියාකාරකම් හා ඔවුන්ට පවත්නා වෙනත් ගැටලු) පදනම් කරගනිමින් සම්මුඛ සාකච්ජා ක්‍රමය යටතේ කාන්තා ශ්‍රමිකයන්ගේ අත්දැකීම් විශ්ලේෂණය කරමින් විස්තරාත්මක තොරතුරු රැස් කළෙමි. මෙම අධ්‍යයනය සඳහා දත්ත හා තොරතුරු රැස් කිරීමේ දී භාවිත කළ මූලාශ්‍රයයන් දෙකකි.

**1) ප්‍රාථමික මූලාශ්‍රයයන්**

මෙම අධ්‍යයනයට අදාළ ප්‍රාථමික මූලාශ්‍රය ගවේෂණය ක්ෂේත්‍ර අධ්‍යයනයක් මගින් සිදු කළ අතර එම අධ්‍යයනය මාස දෙකක කාල සීමාවකට යටත්ව සිදු කෙරිණි. තවද ක්ෂේත්‍ර අධ්‍යයනයේදී පහත සඳහන් මුල් මූලාශ්‍රයයන් මගින් දත්ත හා තොරතුරු ලබා ගැනිණි.

- ප්‍රශ්නමාලා ක්‍රමය
- සම්මුඛ සාකච්ජා ක්‍රමය
- සමීක්ෂණ ක්‍රමය
- සිද්ධි අධ්‍යයන ක්‍රමය

**2) ද්විතියික මූලාශ්‍රයයන්**

අධ්‍යයනයට ඍජුව හා වක්‍රව අදාළ වන මුද්‍රිත මෙන්ම අමුද්‍රිත ලේඛන ද්විතියික මූලාශ්‍රයයන් වශයෙන් භාවිත කළ අතර එම ද්විතියික මූලාශ්‍රයයන් මෙසේය.

- ග්‍රන්ථ
- සඟරා
- ලිපි
- පුවත්පත්
- උපාධි නිබන්ධන
- අන්තර්ජාල ලිපි

**දත්ත හා තොරතුරු විශ්ලේෂණය**

ක්ෂේත්‍ර අධ්‍යයනයෙන් ලබා ගත් දත්ත හා තොරතුරු විශ්ලේෂණය කිරීම සඳහා විස්තරාත්මක ක්‍රමවේදය හා ඓතිහාසික ක්‍රමවේදය යන ද්විත්ත්ව ක්‍රමවේදයන් මෙම අධ්‍යයන තේමාව සඳහා භාවිත කර ඇත. එසේම ප්‍රශ්නාවලිය ඇසුරින් රැස් කරගත් ප්‍රාථමික දත්තයන් සංඛ්‍යානමය මෘදුකාංගයක් වන සමාජ විද්‍යාවන් සඳහා සංඛ්‍යානමය පැකේජය (SPSS/ Statistical Package for Social Sciences) පාදක කරගනිමින් විශ්ලේෂණය කෙරේ.

## පර්යේෂණ ප්‍රතිඵල

ඇඟලුම් ක්ෂේත්‍රයේ ශ්‍රමිකයන්ගේ කීකරු ශ්‍රමය ආයෝජන සඳහා පෙළඹවීමක් බවට පත් කර ගැනීමට ආයොජකයන් සමත් වී ඇති අතර ඇඟලුම් ක්ෂේත්‍රයේ රැකියාවන්හි නියුතු පුරුෂ පක්ෂය ප්‍රධාන වශයෙන් පුහුණු සේවකයන් සහ කළමනාකරුවන් වශයෙන් කටයුතු කරති. වර්තමානය වනවිට කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය, ඇඟලුම් ක්ෂේත්‍රයේ බොහෝමයක් රැකියා ස්ථානවලින් නැගෙන චෝදනාවලින් නිදොස් බවක් පිළිබිඹු කරයි. අලුතින් බිහිවන රැකියා ආයතනයන්හි මෙන්ම සාම්ප්‍රදායිකව බොහෝ කාලයක සිට පැවත එන රැකියා ආයතනයන්හි ද පහසුකම් අතින් යම් යම් සාධනීය වෙනස්කම් ඇතිවීමේ ප්‍රතිඵලයක් වශයෙන් පෙරට වඩා ඒවායේ ධනාත්මක ලක්ෂණ දැකගත හැකි විය. එහෙත් ඒවායේ අභ්‍යන්තර ගැටලු තවදුරටත් පූර්ණ වශයෙන් සමථයකට පත් වී නොමැති බැව් මෙම අධ්‍යයනයෙන් පැහැදිලි විය.

කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඇඟලුම් ක්ෂේත්‍රයේ නියුතු කාන්තා ශ්‍රමික අත්දැකීම් අධ්‍යයනයෙන් සාක්ෂාත් වූයේ කාන්තාවන් වශයෙන් ඔවුන් වෘත්තීමය ගැටලුවලින් මෙන්ම වෘත්තිය දිවියෙන් පරිබාහිර ගැටලු හේතුවෙන් ද පීඩාවට පත්වී සිටින බවයි. එම ගැටලු අතර කායික හා මානසික ගැටලුවලට ප්‍රමුඛතාවක් හිමිවේ. ඒකාකාරී ජීවන රටාව හා කාර්යබහුලත්වය මේ සඳහා මූලික හේතුවක් වී ඇත. ආයතන වැටුප් ගෙවීම් හා සේවා ස්ථානයේ ආරක්ෂාව සම්බන්ධව සෑහීමකට පත්විය හැකි පසුබිමක් නිර්මාණය වී තිබීම සතුටුදායකය. කෙසේවෙතත් අනෙකුත් වෘත්තීන්ට සාපේක්ෂව ඔවුනට අහිමි වී ඇති වෘත්තිමය පිළිගැනීම හමුවේ වුව ද සිය රැකියාවෙන් අපේක්ෂිත මූලික අරමුණු මුදුන් පමුණුවා ගැනීමේ නොපසුබස්නා උත්හයෙන් යුතුව ඔවුහු සේවයේ නියුක්ත වෙති.

කාන්තා උදාරත්වය පිළිබඳ ලූක් සුබාරංචි දැක්ම විමසුමට ලක් කිරීමේදී ලූක් සුබාරංචි කතුවරයාට අනුව පුරුෂයන් මෙන්ම කාන්තාවන් ද දේව අභිමතය අනුව ගැලවීමේ සැලැස්මට සක්‍රීයව දායක වී දිවැසිවර කාර්යයයේ නියැලුණු කීර්තිමත් ප්‍රජාවකි; ජේසුස් වහන්සේ තුළට ඇදහිල්ලෙන් පැමිණි ප්‍රජාවකි; ජේසුස් වහන්සේගේ සුවය අත්දුටු ප්‍රජාවකි; උන්වහන්සේගේ දූත කාර්යයයේ හවුල්කරුවන් පිරිසකි. ලූක් සුබාරංචියට අනුව ජේසුතුමා කාන්තාවන්ට උදාරත්වයක් හිමි කර දුන් සන්දර්භ සමස්ත සුබාරංචිය පුරාම නිරූපිතය. ලූක් සුබාරංචියේ අනෙකුත් සුබාරංචි ග්‍රන්ථ ත්‍රිත්වයට (මාක් සුබාරංචියට, මතෙව් සුබාරංචියට හා ජොහාන් සුබාරංචියට) සාපේක්ෂව කාන්තා චරිත ප්‍රමාණය සංඛ්‍යාත්මකව වැඩි කර ඇති අතර ලූක් සුබාරංචියේ කාන්තාව පිළිබඳ සඳහන් සිදුවීම් හා කතාන්තර ප්‍රධාන වශයෙන් කාණ්ඩ හයක් යටතේ වර්ගීකරණය කළ හැකිය.

1) ජේසුස් වහන්සේගේ උපත සම්බන්ධ කාන්තා චරිත

- එලිසබෙත් හා මරියතුමිය (ලූක් 1:5-24, 1:26-38, 1:39-45, 1:46-56, 1:57-60)

ලූක් දෙවන පරිච්ඡේදයේ සඳහන් ජේසුතුමාගේ උපත සඳහා පෙරවදනක් වශයෙන් ලූක් 1:5-80 ස්නාවක ජොහාන්තුමාගේ උපත පිළිබඳ කතාන්තරය ඉදිරිපත් වී ඇත. එතුමාගේ උපත පිළිබඳ දැනුම්දීමේ දේව දර්ශනය ලැබී ඇත්තේ සිය පියා වූ සකරියස්තුමාටය. සකරියස්ගේ භාර්යාව වූ එලිසබෙත් දරුවන් ලබන වයස පසු කළ ස්ත්‍රීයකි. ජුදා සම්ප්‍රදාය අනුව දරුවන් නොමැති වීම අපකීර්තියට හා අවමානයට පාත්‍ර වන්නකි. තවද එය අවාසනාවන්තභාවයේ හා දේව දඬුවමේ සංකේතයක් විය (Brown, 680). ජුදා සමාජයෙන් අපකීර්තියට හා උපහාසයට පාත්‍රව සිටි සකරියස්ගේ බිරිඳ මහලු වයසේ දී වුවද ගැබ්ගෙන පුත්‍රයෙකු බිහි කළාය. ඒ සමඟ ම ඇය විඳි අපහාසවලින් නිදහස් විය.

ස්නාවක ජුවාම්තුමාගේ දෙමාපියන් දෙදෙනා වන සකරියස් හා එලිසබෙත් පිළිබඳ හැඳින්වීමක් ද ලූක් පළමු පරිච්ඡේදයේ සඳහන් වේ. එම හැඳින්වීමට අනුව ස්නාවක ජුවාම්තුමාගේ දෙමාපියෝ පූජක පෙළපතට නෑකම් කියති. ශුද්ධවූ බයිබලයේ බොහෝ අවස්ථාවල බිරින්දෑවරුන් පිළිබඳ සඳහන් කරන විට ඔවුන්ගේ නාමය පමණක් සඳහන් කර ඇති අතර පෙළපත් නාම සඳහන් ස්ථාන ඉතා අල්ප ය. එහෙත් මෙහි සකරියස්ගේ බිරිඳ එලිසබෙත් බැව් ඍජුව නොපවසා ඇයගේ පෙළපත් නාමය පිළිබඳ යම් අනාවරණයක් ලූක් සුබාරංචි කතුවරයා ගෙනහැර දක්වා ඇත. මෙලෙස ලූක් සුබාරංචියේ කාන්තා චරිත ඉදිරිපත් කිරීමේදී සමාන ගරුත්වයකින් හා වැදගත්කමකින් යුක්තව ඉදිරිපත් කර ඇති බවට එය කදිම නිදසුනකි.

තවද ජේසුතුමාගේ උපත පිළිබඳ දැනුම් දීම නව ගිවිසුමේ මතෙව් හා ලූක් සුබාරංචි කතුවරුන් පමණක් සඳහන් කර ඇත. එහෙත් මෙම කතුවරුන් දෙදෙනාට අනුව ජේසුතුමාගේ උපත පිළිබඳ දැනුම් දීමේ සිද්ධිය අනන්‍ය වී ඇති පුද්ගල චරිත විවිධත්වයෙන් යුක්තය (Herman, 4). මතෙව් සුබාරංචියේ ගැලවීමේ සැලැස්ම හා ජේසුතුමාගේ උපත පිළිබඳ දැනුම් දීම අනන්‍ය වී ඇත්තේ ජුසේතුමා සමඟය. එහෙත් ලූක් සුබාරංචියේ ජේසුතුමාගේ උපත දැනුම් දීම පිළිබඳ කතා පුවතේ කේන්ද්‍රීය චරිතය වී ඇත්තේ මරියතුමියයි (Balasuriya, 49). ලූක් 1:46-56 සඳහන් මරියාවන්ගේ උදාන

ගීතය දේව ප්‍රශංසාවේ ගීතයකි (Timothy, 41)[2]. නව ගිවිසුමේ පළමු දිවැසිවරිය වශයෙන් එතුමිය තම පුතු වන නාසරතයේ ජේසු පලස්තීන ජන සමාජයේ ඇති කිරීමට අපේක්ෂා කරන සංස්කෘතික, දේශපාලන, ආගමික විප්ලවය පිළිබඳ පූර්ව දැක්මක් ද එහි අනාවරණය කර ඇත (Balasuriya, 115)[3].

2) වැන්දඹුවන්

- අන්නා දිවැසිවරිය (ලූක් 2:36-38)
- ශරෙපත්හි වැන්දඹුව (ලූක් 4:25-30)
- නායින් නුවර වැන්දඹුව (ලූක් 7:11-17)
- වැන්දඹුව හා විනිශ්චයකාරයා පිළිබඳ උපමාව (ලූක් 18:1-8)
- වැන්දඹුවගේ පඬුර (ලූක් 21:1-4)

ලූක් 21:1-4 සඳහන් 'වැන්දඹුවගේ පඬුර' පිළිබඳ කතා පුවත පමණක් මාක් සුබාරංචියේ (මාක් 12:41-44) දැකගත හැකි අතර ඉහත අනෙකුත් චරිත සියල්ලම ලූක් සුබාරංචියට පමණක් ආවේණික වැන්දඹු කාන්තා චරිත වේ. අන්නා දිවැසිවරිය වැන්දඹුවක් වුවත් ඇයගේ චරිතය ලූක් සුබාරංචි කතුවරයා ගෞරවනීව ඉදිරිපත් කරයි. එසේම ශරෙපත්හි වැන්දඹුව හා නායින් නුවර වැන්දඹුව ජේසුතුමාගේ දායානුකම්පාවට පාත්‍ර වූ වැන්දඹු චරිත ලෙස හුවා දක්වයි. වැන්දඹුව හා විනිශ්චයකාරයා පිළිබඳ උපමාවෙන් ඇයව අධිෂ්ඨානශීලීභාවයේ පරමාදර්ශයක් වශයෙන් ද, වැන්දඹුවගේ පඬුර පිළිබඳ කතාවෙන් තමා සන්තක මුළු වත්කම පඬුරු වශයෙන් පිදීමේ ඇයගේ ප්‍රශස්ත ක්‍රියාව අගයමින් ද ඉදිරිපත් කරයි. මන්දයත් එකල ජුදා සමාජයේ වැන්දඹුවන් යනු සමාජ අයිතීන් අහිමි සූරාකෑමේ හා මර්දනයේ සංකේත බවට පත්වූ ප්‍රජාවකි (දිසානායක, 14). එහෙත් ජේසුතුමා ඔවුන්ට පිළිසරණක් වූ බවත් ඔවුන්ගේ දුක්ඛිත තත්ත්වය කෙරෙහි සංවේදී වූ බවත් ලූක් සුබාරංචිය සඳහන් කරයි.

3) ජේසුස් වහන්සේ වෙතින් සුවය ලැබූ පව්කාර හෝ රෝගී තත්ත්වයන් තුළ සිටි කාන්තාවන්

- පව්ටු අඟන (ලූක් 7:36-50)
- ජායිරස්ගේ දියණියඃ සළුවට අතගැසූ ස්ත්‍රීය (ලූක් 8:40-56)
- කුදු ස්ත්‍රීයට සුවය (ලූක් 13:10-17)
- පේදුරුගේ භාර්යාවගේ මව හා වෙනත් අය සුව කිරීම (ලූක් 4:38-39)

පළමු ශතවර්ෂයේ පලස්තීනයේ සිටි ජුදා ජනතාව, දෙවියන් වහන්සේ තමන්ව අනෙකුත් ජාතීන් අතරින් වෙන් කර තෝරා ගනු ලැබීම හේතුවෙන් තමන් 'ශුද්ධ ජනතාවක්' ය යන ආකල්පය ඔවුන් තුළ තිබිණි. ජුදාවරුන් ශාරීරික ශුද්ධවන්තභාවය ඉතා ඉහළින් අගය කළ අතර ඔවුන් අතරෙන් යමෙක් රෝගී හා පව්කාර නම් ඔවුන් අශුද්ධ ජනතාවක් වශයෙන් වෙන් කර සැලකීය. එම ජනතාව ජුදා සංසවලින් ඉවත් කිරීමටත්, කොන් කිරීමටත් ජුදා ජනතාව පෙළඹිණි. එහෙත් ලූක් සුබාරංචියේ

---

[2] මෙම ප්‍රශංසා ගීය මරියාවන්ගේ උදාන ගීය (Mary's Magnificat) ලෙස හඳුන්වන අතර මෙම ගීතය 1 සාමුවෙල් 2:1-10 සඳහන් හන්නාගේ ප්‍රශංසා ගීතයට බෙහෙවින් සමානකමක් දක්වයි.

[3] "He has shown strength in his arm and scattered the proud-hearted. That is the first type of cultural nature…… 'And cast down the mighty from their thrones'. The politically mighty who are dominating their countries and the world system will be put down. The humble people will be lifted up…God will fill the hungry with good things and send the rich empty away'. This refers to the economic aspect of the radical changes envisaged in prophecy".

රෝගී හා පව්කාර ජනයාට සුවිශේෂ අවධානයක් ලබාදී ඇත. තවද ශුද්ධත්වය, චාරිත්‍රමය පවිත්‍රතාව හා සමාජයෙන් වෙන් කර හඳුනා ගැනීම යනාදිය අභියෝගයට ලක් කරමින් ඒ වෙනුවට සමාව දීම, ආදරය හා විශ්වාසය යනාදි ගුණාංග සමග ශුද්ධත්වය පිළිබඳ නව ආකල්ප ඇති කරයි.

භෝජනයක් මගින් සංඝයක සාංඝිකත්වය ශක්තිමත් කරයි. ලූක් 7:36-50 සීමොන් නම් පරිසිවරයාගේ නිවසේ පැවති භෝජන සංග්‍රහයට ජේසුස් වහන්සේට ඇරයුම් කෙරිණි . එහෙත් එම අවස්ථාවට එකල සමාජයේ පව්කාර යැයි හංවඩු ගැසූ ස්ත්‍රියක් පැමිණියාය. එහිදී සීමොන්ගේ චරිතය මගින් ශුද්ධවන්තකමේ චාරිත්‍ර හා බැඳි ආගමික චාරිත්‍ර නිරූපණයත් පව්කාර ස්ත්‍රිය විශ්වාසය හා බැඳි ගිහි ජීවිතයත් නිරූපණය කරයි. මෙම වෘත්තාන්තයට අනුව දේව සබඳතාවට පිවිසීමට හැකි වූයේ ඇරයුම් නොලැබ පැමිණි පව්ටු අගනටයි. ඇය තම පාපවලට කමාව ලැබ ගැලවීම ලබා ගත්තාය.

ලූක් 8:40-56 ජායිරස් නැමති ධර්මශාලා ප්‍රධානියාගේ දියණිය සුව කිරීමේ කතා පුවතේ එන අන්තර් කතා පුවතක් වශයෙන් සළුව ස්පර්ශ කළ ස්ත්‍රියගේ කතා පුවත ඉදිරිපත් වේ. සළුව ස්පර්ශ කළ ස්ත්‍රිය හා ජායිරස්ගේ දියණිය යන දෙදෙනාම ජේසුතුමාගේ සුවය ලැබීමේ බලාපොරොත්තුවෙන් සිටියහ. ජායිරස් ජුදා ශුද්ධවත් බව පිළිබඳ නීති ආරක්ෂා කළ ධර්මශාලා ප්‍රධානියෙකු වුවත් ඔහුගේ දුවණිය අශුද්ධවත් ලෙස ගණන් ගනු ලැබ රෝගී වී මිය යාමට ආසන්නව සිටියේය.

මහලේ රෝගී ස්ත්‍රිය අශුද්ධ තැනැත්තියක් වශයෙන් සිය රෝගයෙන් ද, සමාජයෙන් ද, දොළොස් වසරක් මුළුල්ලේ පීඩා වින්දාය. සමූහයා අතරේ ඇය ජේසුතුමා සොයා පැමිණියේ සුවය ලැබීමේ අපේක්ෂාවෙනි. ශුද්ධවන්තකම පිළිබඳ වූ ජුදා නීති කඩ කරමින් ඇය ජේසුතුමාගේ සළුවට අත ගැසීමට තරම් ධෛර්යයවන්ත වූවාය. ජුදා නීතිය අනුව අපවිත්‍ර පුද්ගලයෙකු ස්පර්ශ කරන කවරෙක් වුවද, ඔහුව අපවිත්‍ර පුද්ගලයෙකු ලෙස ගණන් ගනු ලැබී ය (දිසානායක, 30). එහෙත් ජේසුතුමා එම ජුදා නීති අභිබවමින් ක්‍රියා කළේය. මහලේ රෝගී ස්ත්‍රිය සුව කිරීමේ අතුරු කතා පුවතින් පසු කතුවරයා නැවතත් ප්‍රධාන කතා පුවත වන ජායිරස්ගේ දුවණිය පිළිබඳ කතාව අරඹයි.

මහලේ රෝගී ස්ත්‍රිය සුව කිරීමේ සිදුවීම් මාලාව නිසා ජායිරස්ගේ නිවසට පැමිණීමේදී සිදුවූ ප්‍රමාදය හේතුවෙන් ජායිරස්ගේ දියණිය මිය ගොස් ඇති බව සමූහයාගෙන් අසන්නට ලැබෙයි. එහෙත් ජේසුතුමා ශුද්ධවන්තකම පිළිබඳ නීති පසෙකලා ඇයගේ අතින් අල්ලා ඇයව නැගිටුවීය. වයස අවුරුදු 12 සපුරා තිබූ විවාහ වීමේ වයසේ පසුවූ කාන්තාවකගේ අතින් ඇල්ලීම ජුදා සමාජය වික්ෂිප්ත කළ සිදුවීමක් වනු නොඅනුමානය. රබ්බිවරයෙකු ප්‍රසිද්ධියේ මෙලෙස කාන්තාවක් ස්පර්ශ කිරීම ජුදා සමාජය පිළිකුලට ලක් කළේය.

ලූක් 13:10-17 සබත් දිනක කුදු ස්තීයක් සුව කිරීමේ සිදුවීම නිසා ජේසුතුමා හා ධර්මශාලා ප්‍රධානියෙකු අතර ඇති වන දෙබසක් දක්නට ලැබේ. ධර්මශාලා නායකයාට අනුව 'වැඩපල කිරීම සඳහා දවස් හයක් ඇත. එහෙත් සබත් දවස ශුද්ධ දවසක් වන නිසා එදින වැඩ නොකළ යුතුය.' මෙහිදී සුව කිරීම ද වැඩක් වශයෙන් සලකා ඇති බැව් පෙනේ. සබත් දින කළ යුතු වැඩ හා නොකළ යුතු වැඩ පරිසිවරු ලැයිස්තු ගත කළහ. එහිදී කළ යුතු වැඩ වශයෙන් ලේඛන ගත කළ ලැයිස්තුවේ සුව කිරීම ද එක් අංගයක් විය (දිසානායක, 30). එහෙයින් සුව කිරීම සබත් දිනයේ නොකළ යුත්තක් බවට ධර්මශාලා ප්‍රධානියා තර්ක කරයි. ජේසුතුමාට අනුව සුව කිරීම යනු දේව ක්‍රියාකාරීත්වයේ පිළිබිඹුවක්

වන අතර එය සබත් දිනයේ කළ යුතු කර්තව්‍යයකි. යහපත කිරීම සඳහා සබත බාධාවක් කර නොගත යුතු වුවත් ධර්මශාලා නායකයා එය යහපත කිරීමට බාධාවක් කරගෙන ඇති බැව් පෙනෙයි.

ලූක් 4:38-39 ජේසුතුමා පේදුරුගේ නැන්දණියගේ උණ රෝගය සුව කිරීමෙන් පසු ඇය ජේසුතුමාට උපස්ථාන කරන්නට පටන් ගත්තාය. එකල ජුදා සමාජයේ කාන්තාවකගෙන් උපස්ථාන ලැබීම රබ්බිවරයෙකුට නුසුදුසු ක්‍රියාවක් විය. එහෙත් ජේසුතුමා ස්ත්‍රී-පුරුෂ භේදයෙන් තොරව සියලුදෙනා සමඟ සමානාත්මතාවයෙන් හා ප්‍රේමයෙන් යුක්තව කටයුතු කළේය.

4) උපමා

- නැති වූ කාසිය (ලූක් 15:8-10)

මෙම උපමාව පැවසීමට හේතු වූයේ ජේසුතුමා පව්කාරයන් පිළිගෙන ඔවුන් සමඟ කන බොන බවට පරිසිවරුන් හා විනයධරයන් මැසිවිලි කීමයි. මෙයට පිළිතුරු වශයෙන් ජේසුතුමා නැති වූ බැටළුවා පිළිබඳ උපමාව, නැති වූ කාසිය පිළිබඳ උපමාව හා නැති වූ පුත්‍රයා පිළිබඳ උපමාව යනාදී උපමා තුනක් වදාළ සේක. නැති වූ බැටළුවා පිළිබඳ උපමාවට සමාන්තරව නැති වූ කාසිය පිළිබඳ උපමාව නිර්මාණය වී ඇත. නැති වූ බැටළුවා පිළිබඳ උපමාවේ බැටළුවන් සියයක් සිටින මිනිසෙක් ගැන කියැවෙන අතර නැති වූ කාසිය පිළිබඳ උපමාවේ රිදී කාසි දහයක් ඇති කාන්තාවක් ගැන කියැවේ.

5)උපස්ථායික කාන්තාවන් හා ශ්‍රාවිකාවන්

- උපස්ථායිකාවෝ (ලූක් 8:1-3)
- ජේසුස් වහන්සේගේ සහෝදරයෝ හා මෑණියෝ (ලූක් 8:19-21)
- මාර්තා හා මරියා (ලූක් 10:38-42)
- මරියතුමියගේ කුසය හා පියයුරු භාග්‍යවත් බව පැවසූ ස්ත්‍රීය (ලූක් 11:27-38)

ජේසුතුමාට උපස්ථාන කළ කාන්තා චරිත පිළිබඳව ලූක් සුබාරංචි කතුවරයා සඳහන් කරයි. ඒ අතරින් ලූක් 8:1-3 මරිය මග්දලේනා, ජොවන්නා හා සුසානා යන කාන්තා චරිත පිළිබඳව සඳහන් වේ. ලූක් 10:38-42 මාර්තා හා මරියා සම්බන්ධ කතා පුවතින් සාමාන්‍ය ජුදා චාරිත්‍රවලට වඩා ජේසුතුමා ශ්‍රාවකත්වය අගය කළ අකාරය ඉස්මතුවී පෙනෙයි. මාර්තා හා මරියා සොයුරියන් දෙදෙනෙකි. මාර්තා ජේසුතුමාව තම නිවසට පිළිගත් පසු එතුමාට ආගන්තුක සත්කාර කිරීමේ කටයුතු සමග කාර්යබහුල වූවාය. ඇයගේ සහෝදරිය වන මරියා ජේසුතුමාගේ ඉගැන්වීම්වලට සවන් දී සිටි අතර මාර්තා ඒ පිළිබඳව මැසිවිලි නැගුවාය. මාර්තාගේ සිත මෙලෙස වියවුල් වීමට බලපෑ හේතුව වූයේ කාන්තාවක වූ මරියා රබ්බිවරයෙකුගේ ඉගැන්වීම්වලට සවන් දී සිටීමයි. ජුදා රබ්බිවරයෙකුගේ ඉගැන්වීම්වලට සවන් දීම හා ඉගෙන ගැනීම ජුදා සමාජයේ කාන්තාවට අහිමි වරප්‍රසාදයක් විය (දිසානායක, 37). ජුදා ආගමික හා සමාජීය පිළිවෙත් අනුව මරියාට උරුමව තිබුණේ මුළුතැන්ගෙය වුවත්, ජේසුතුමාගේ පාමුල හිඳ දේව වචනයට සවන් දීම පිළිබඳ මරියාගේ තෝරා ගැනීම ජේසුතුමා අගය කළේය.

6) ජේසුස් වහන්සේගේ දුක් විඳීම, මරණය හා උත්ථානය සම්බන්ධ සිදුවීම්වල එන කාන්තා චරිත

- ජෙරුසලමේ ස්ත්‍රීන් (ලූක් 23:27-31)
- ජේසුතුමාගේ කුරුසපත් වීම බැලීමට ගිය ස්ත්‍රීන් (ලූක් 23:49)
- ජේසුතුමාගේ මෘත දේහය තැන්පත් කළ අන්දම බැලූ ස්ත්‍රීන් (ලූක් 23:55-56)
- ජේසුතුමාගේ උත්ථානය (ලූක් 24:1-12)

ජේසුතුමාගේ කුරුසපත් වීම, මෘත දේහය භූමදානය හා උත්ථානය සම්බන්ධ සිදුවීම්වල කාන්තාවන් සිටි බව සඳහන් වේ. ජේසුතුමාගේ උපතේ සිට උත්ථානය දක්වා කාන්තා චරිත බද්ධව පැවතීමෙන් උන්වහන්සේගේ දූත කාර්යයයේ සුවිශේෂ ප්‍රජාවක් වශයෙන් කාන්තාවට වැදගත්කමක් ලබාදී ඇති බැව් පෙනෙයි.

ජුදා සමාජයේ කාන්තාවට අහිමිව තිබූ මානව අයිතීන් අනුමත නො කරමින් ජේසුතුමා සමඟ සාංඝික වීමට ඔවුන්ව කැඳවූ සේක. දේව රාජ්‍ය උරුම කරගැනීමට ස්ත්‍රී-පුරුෂ, ධනවත්-දිළිඳු යනාදී සමාජ විෂමතා බාධාවක් නොවන බැව් එතුමා පෙන්වා දුන්නේය. වර්තමාන ඇඟලුම් ක්ෂේත්‍රයේ නියුක්ත කාන්තාවන් හා ලූක් සුබාරංචියේ පිළිබිඹු වන කාන්තාව අතර පවතින සමාජ ගැටලුවල සන්දර්භය විවිධ වූවත් කාන්තා උදාරත්වයට හානි පමුණුවන පීඩිත ව්‍යුහයන් (සමාජ, සංස්කෘතික නිදහස හා කායික මානසික නිදහස, සමානාත්මතාව, සම අයිතීන් තහවුරු වීම, යුතුකම් හා වගකීම්, සමාජ පිළිගැනීම හා ප්‍රේමය) මෙම සමාජ සන්දර්භයන් ද්විත්වයටම පොදු වූවකි.

**සමාජ, සංස්කෘතික නිදහස හා කායික මානසික නිදහස** - ශ්‍රී ලංකාව යටත්විජිතවාදයෙන් නිදහස ලබා වසර 70කට ආසන්න කාලයක් ගත වුවත්, තවමත් යටත්විජිත මානසිකත්වයේ යදම්වලින් මිදීමට නොහැකි වී ඇත (විජේතුංග, 203). අන්තර්ජාතික වශයෙන් මෙන්ම දේශීය ධනවතුන්ගේ පීඩන හමුවේ ගොවි, ධීවර, වතු කම්කරු හා ඇඟලුම් ක්ෂේත්‍රයේ නියුක්ත ශ්‍රමිකයෝ තවමත් විවෘත ආර්ථිකයේ වහලුන් වී සිටිති. රාජ්‍යයක් ඉසුරුමත් වන්නේ කම්කරු ජනතාවගේ ශ්‍රමයෙන් වූවත්, රටක ශ්‍රමික ප්‍රජාව යනු වහලුන් හෝ යන්ත්‍ර සූත්‍ර නොවේ. එනිසා ඔවුන් පිළිබඳ මානුෂීය වශයෙන් සිතා ක්‍රියා කළ යුතු ය. 'වැඩ කිරීම' මිනිසාගේ කායික ශක්තිය වර්ධනයට රුකුලක් වේ. එනමුත් නිසි වේලාවට එම කාර්යයන් අවසන් කර විවේකයක් ලබා ගැනීම ද අනිවාර්යය වේ. වැඩ කරන්නාගේ හැකියා හා ශක්ති ප්‍රමාණය අභිබවා කාර්යයන්හි නියුක්ත වීම නොකළ යුත්තකි.

ශ්‍රමිකයන්ට ළඟා කරගත නොහැකි තරමේ නිෂ්පාදන ඉලක්ක ලබා දීමත්, නිෂ්පාදන ඉලක්ක නම් තුරඟ තරග පිටියේ හැකියා හා ශක්ති ප්‍රමාණය ඉක්මවා යමින් කායිකව හා මානසිකව ශ්‍රමිකයන් පීඩාවට පත්කිරීම ශ්‍රමිකයන්ගේ මානුෂීය නිදහස කෙලෙසීමකි.

තම කායික හා මානසික නිදහස් පරිසරයක් ඇති කරගැනීමට ආයතනයේ දී මෙන්ම ආයතනයෙන් පිටත දී ද ශ්‍රමිකයන්ට අවස්ථා සැලසී තිබිය යුතු වුව ද. වර්තමාන ඇඟලුම් ආයතනයන්හි අධික වෙහෙසට පත්ව සිටින කාන්තා ශ්‍රමිකයන්ට ආයතනයේ දී මෙන්ම ආයතනයේ රැකියාව අවසන් කර නිවසට පැමිණි පසු ද කායික හා මානසික නිදහස් සුවයක් අත්දැකීමේ අවස්ථා ගිලිහී ගොස් ඇත. තමා ලත් උත්තරීතර මනුෂ්‍යත්වය වැඩ කිරීම සඳහා හැරුණුකොට වෙනත් කර්තව්‍යයකට දායක කිරීමට මොවුනට නොහැකි වී ඇත. වැඩ කිරීම මිනිසා උදෙසා මිස, මිනිසා වැඩ කිරීම සඳහා නොවිය යුතු වූව ද, මිනිසා වැඩ කිරීම සඳහා ජීවත් වන සෙයක් විද්‍යාමාන වේ. සිය ජීවිතය වෘත්තිය පමණක් කරගත් මොවුනට මිනිස් ජීවිතය වින්දනය කිරීමට ලැබෙන අවස්ථා විරලය.

ඇඟලුම් ක්ෂේත්‍රයේ කාන්තාවන්ගේ සමාජ සංස්කෘතික මෙන්ම කායික හා මානසික නිදහස පිළිබඳව විමසා බැලූ පසු මෙම නිදහස බයිබලීය පසුබිම සමග සන්සන්දනය කිරීමේ දී එකල ජුදා සමාජයේ පැවති සබත් නීතිය නිතැතින්ම සිහිපත් වේ. සබත, ජුදා දහමේ කේන්ද්‍රීය හා සුවිශේෂ අංගයක් විය. ජේසුස් වහන්සේගේ සමයේ පලස්තීනයේ මිනිස් නිදහස තහවුරු කිරීමටත් යහපත ඉටු කිරීමටත් පැවති සබත වැරදි අන්දමින් අර්ථකථනය කර තිබුණි. සබත තත්කාලීන ජුදා ජනයාගේ නිදහස අහිමි කරන තරමේ පීඩාකාරී තත්ත්වයක් ඇති කළේය. එය දෙවියන් වහන්සේගේ නීතිය පරිසිවරුන් අර්ථකථනය කළ ආකාරය නිසා සිදුවූවකි. පරිසිවරු "සුවය දානය කිරීම්" ද වැඩක් වශයෙන් සලකා ලැයිස්තු ගත කළහ. ඒ අනුව 'සුවය දානය කිරීම්' සබත් දිනයේ නොකළ යුත්තක් වශයෙන් නීතිගතවී තිබිණි. සැබවින්ම සබතට මිනිසා වහල්වී තිබිණි. සබත මිනිසා සඳහා තිබිය යුත්තක් වූව ද, මිනිසා සබත සඳහා වූ ජීවන රටාවක් තිබිණි. මෙහි 'සබත මිනිසා උදෙසා මිස, මිනිසා සබත උදෙසා නොවේ' යන වාක්‍යයෙන් මෙන්ම ඉහත සඳහන් කළ 'වැඩ කිරීම මිනිසා උදෙසා මිස, මිනිසා වැඩ කිරීම උදෙසා නොවේ' යන වාක්‍යයෙන් ද ගම්‍ය වන්නේ එකම යථාර්ථයකි. එනම්, මිනිසා කිසිම භෞතික ද්‍රව්‍යයකට වහල් නොවී තම උත්තරීතර නිදහස සඳහා ප්‍රමුඛතාවක් ලබා දිය යුතු බව ය. මිනිසා උදෙසා තිබිය යුතු සබත වෙනුවට, මිනිසා සබත උදෙසා සිටීමෙන් මිනිසා සබතේ වහලෙක් බවට පත්වේ.

ජේසුතුමා මිනිස් වර්ගයාට සේවය කරනු වෙනුවට ඔවුන් වහලුන් කිරීමට යොදා ගත් නියම, නීති-නියෝග හා දේව මාලිගා පූජාවන් සැමවිටම ප්‍රතික්ෂේප කළ අතර ඒවායේ අර්ථ ශූන්‍ය බවත් ජනයා සූරාකෑමට ලක් කරන අවස්ථා බවත් පෙන්වා දුන්නේය. ජේසුස් වහන්සේට අනුව "සුව කිරීම" දේව ක්‍රියාකාරීත්වයේ පිළිබිඹුවක් වන අතර එය සබත් දවසේ කළ යුතු කර්තව්‍යයකි. යහපත කිරීම සඳහා සබත බාධාවක් නොවිය යුතුය. ජේසුතුමා සබත පිළිපැදීමේ ජුදාවරුන්ගේ නීතිමය ප්‍රවේශය අභිබවා යමින් සුව කිරීමෙන් ජනයාට රෝගී බවින් විමුක්තිය ළඟා කර දුන්නේය.

තවද, පීතෘ මූලික සමාජ ව්‍යුහයේ කාන්තාව තම ස්වාධීනත්වය හා නිදහස අහිමි තැනැත්තියක් බවට පත්වී තිබිණි. ජුදා කාන්තාවට නිදහසේ ප්‍රසිද්ධ ස්ථානයන්හි පුරුෂයෙක් සමග කථා කිරීම, දේවස්ථානයේ අභ්‍යන්තරයට යාම, ජුදා පාස්කුවට සම්බන්ධ වීම, අධ්‍යාපනය ලැබීමේ නිදහස අහිමිව තිබිණි. එහෙත් ජේසුතුමා උන්වහන්සේගේ නෙත ගැටුණු කාන්තාවන්ට එම වහල් බැමි අභිභවා සමාජ විමුක්තිය ප්‍රදානය කිරීමට ක්‍රියා කළේය.

**සමානාත්මතාව** - ශ්‍රී ලංකාවේ ද ධනවත්-දිළිඳු පරතරය බොහෝසෙයින් දක්නට ලැබෙන අතර මෙම විෂමතාවට හේතු වන්නේ සම්පත් හා ශ්‍රමය සූරාකෑමයි. ආයෝජකයන්ගේ ධන මූලාශ්‍ර බවට පත්ව ඇති ඇඟලුම් ක්ෂේත්‍රයේ කාන්තා ශ්‍රමය සූරාකෑම වර්තමානයේ සුලබව සිදුවේ. මනුෂ්‍යයෙක් වශයෙන් උපත ලත් සෑම පුද්ගලයෙක්ට ම නිෂ්පාදන මාධ්‍යයේ හා ආර්ථිකයේ සම අයිතියක් ඇත (විජේසිංහ, 75). එසේම එක් එක් පුද්ගලයන්ගේ ජාති-භේද, කුල-භේද හා ලිංගභේද නොතකා ඔවුන් සියලුදෙනා සම තත්ත්වයේ ලා සැලකිය යුතුය. ප්‍රජාවගේ වෙනස්කම් නොසලකා සියල්ලන් සමඟ සාමූහිකව කටයුතු කළ යුතුය. සේවා ආයතනයක පහළ මට්ටමේ ශ්‍රමිකයාගේ සිට ඉහළ මට්ටමේ ශ්‍රමිකයා දක්වාම සමානාත්මතාවයෙන් සැලකිය යුතුය. තනතුරු හා වත්පොහොසත්කම්වලට මූලිකත්වය දී පහළ මට්ටමේ ශ්‍රමිකයන් පීඩාවට පත් නොකළ යුතුය. ඇඟලුම් ක්ෂේත්‍රයේ වඩාත් පීඩිත ප්‍රජාව වන්නේ 'මැහුම්' ශ්‍රමිකයන්ය. එසේම ශ්‍රමය බෙහෙවින් වැය කරන්නෝ ද මොවුහු වෙති.

සේවා ආයතනවල කාන්තා ශ්‍රමිකයන්ට මානුෂීය අන්දමින් සැලකිය යුතුය. වහලුන් මෙන් අඛණ්ඩව දිවා-රෑ වැඩ ගැනීම සාධාරණ නොවේ. සේවයේ උසස් වීම් ලබා ගැනීමට හැකි ව්‍යුහයක් මෙන්ම එම ව්‍යුහය ඔස්සේ පහළ මට්ටමේ ශ්‍රමිකයෙක්ට තම හැකියා හා කුසලතා අනුව හෝ එම කුසලතා හා සුදුසුකම් වර්ධනය කරගනිමින් ඉහළ මට්ටමේ තනතුරක් වෙත ළඟා වීමේ හැකියාවක් පැවතිය යුතුය. සිය රැකියා ජීවිතයේ අවසානය තෙක්ම අසාධාරණ ලෙස ශ්‍රම සූරා කෑමට ලක්වෙමින්, කුසලතා හා හැකියා අඩු තක්සේරුකරණයට ලක් වීමට සිදුවීම ශ්‍රමිකයන්ට හිමිවිය යුතු සමානාත්මතාව උල්ලංඝනය කිරීමකි.

දිව්‍ය වෛද්‍යවරයාණන් වූ ජේසුතුමා රෝගීන් සුවපත් කිරීමේ දී ජාති, වංශ, කුලීන-කුලහීන හා ස්ත්‍රී-පුරුෂ භේද නොසලකා උන්වහන්සේගෙන් සුවය පැතූ සියල්ලන්ට සුවය දානය කළ සේක. ජායිරස් නැමති ධර්මශාලා ප්‍රධානියාගේ දුවණියටත්, එකල සමාජයේ අශුද්ධ යැයි ගණන් ගනු ලැබ සිටි මහලේ රෝගී ස්ත්‍රියටත් එකසේ සුවය ලැබීමේ වරම දානය කළේය. සම්ප්‍රදාය විරෝධීව කටයුතු කළ නිසා බොහෝ අවස්ථාවල පරිසිවරුන්ගේ දෝෂ දර්ශනයට ලක්වීමට සිදුවූව ද, සමානාත්මතාව, යුක්තිය හා සාධාරණය වෙනුවෙන් ක්‍රියා කිරීමට එතුමා පසුබට නොවූවේ ය. රෝගීන්ට මිස නිරෝගීන්ට වෙදෙකුගේ අවශ්‍යතාවක් නොමැති පරිද්දෙන් උන්වහන්සේ ද පව්වූ, දුබල, කොන්වූ හා පීඩිත ජනයා හට දේව රාජ්‍යයේ සුබාරංචිය දෙසූ සේක. දේව රාජ්‍යය උරුම කරගැනීමේ අයිතිය සියලුදෙනාටම හිමි කරගත හැකි බව එතුමාගේ ඉගැන්වීම විය. ඒ සඳහා සමාජ විෂමතා බාධාවක් නොවන බව එතුමා අවධාරණය කළේය.

සමාජයෙන් කොන්වී හා පීඩාවට පත්වී සිටි, අයකැමියන් හා පව්කාරයන් සමග එකට හිඳ ආහාර ගත් ජේසුතුමා වැළඳීමේ සහභාගීත්වය (Table fellowship) මගින් ඔවුන්ගේ සමානාත්මතාව අගය කළේය. නූතන සංස්කෘතියේ මෙන් ජුදා සමාජයේ ද, එක්ව ආහාර වේලක් අනුභව කිරීම මගින් මිත්‍රත්වය තහවුරු කිරීම හා තම සංඝයට සම්බන්ධ කර ගැනීම සංකේතවත් විය. අයකැමියන්ට හා පව්කරුවන්ට සමාජයේ අහිමිව තිබූ සහභාගීත්වය ප්‍රතික්ෂේප කරමින් එතුමා සමඟ සහභාගීත්වයට ඔවුන්ව පිළිගත්තේය.

සමාජ නායකත්වයෙන් සමානාත්මතාව ගිලිහී යනුයේ ධනය, බලය, කීර්තිය හා පීඩනය මත පදනම් වූ නායකත්වය නිසාය. එහෙත් ධනය, බලය, කීර්තිය හා පීඩනය පසෙකලා සේවය මත පදනම් වූ නායකත්වය සමානාත්මතාව සුරක්ෂිත කරයි. ජේසුතුමා තුළ වූ නායකත්වය ධනය, බලය, කීර්තිය හා පීඩනය පසෙකලා සේවය මත පදනම් වූ නායකත්වයකි. එතුමාට සමාජයේ සමානාත්මතාව හා සාමූහිකත්වය මත පදනම් වූ නව සමාජය පෙරළියක් ඇති කිරීමට හැකි වූයේ එහෙයිනි.

ජුදා සමාජයේ දියණියන්ට, පිරිමි දරුවන්ට මෙන් වටිනා හා සමාජ පිළිගැනීමක් නොලැබිණි. උපදින ළමයින් පිරිමි දරුවන් වන්නේ නම් සෑමවිටම එය ජුදා සමාජයේ පිළිගැනීමට පාත්‍ර විය. එහෙත් පවුලක ගැහැණු දරුවන් එසේ සමාජ පිළිගැනීමෙන් තොර වූ නොවටිනා ප්‍රජාවක් විය. ලූක් සුබාරංචියට අනුව ජේසුතුමා විසින් නායින් නුවර වැන්දඹු ස්ත්‍රියගේ පුත්‍රයාට නැවත ජීවිතය දානය කිරීමේ දී ඔහුගේ ජීවිතයට මෙන්ම ජායිරස්ගේ දියණියගේ ජීවිතයටත් එක හා සමාන වැදගත්කමක් හා වටිනාකමක් හිමි කර දෙන ලදී.

**සම ෛෙතිවාසිකම් තහවුරු වීම** - ඇඟලුම් ක්ෂේත්‍රයේ රැකියාවල රාත්‍රි වැඩමුර සඳහා පවතින අවසරය හේතුවෙන් කාන්තා ශ්‍රමය උපරිම අයුරින් යොදා ගැනීමට ආයෝජකයන්ට හැකිවී ඇත. වැඩ කරන වේගය හා නිෂ්පාදන දායකත්වය ඉතා ඉහළ වන අතර කම්කරු ශ්‍රමිකයන් පාලනය ද ඉතා දැඩිය. ශ්‍රමිකයන්ගේ පැමිණීම පිළිබඳව දැඩි නීති පවතින අතර ලිංගික වශයෙන් ඔවුන්ව සූරාකෑම ද විරල නොවේ. සේවා ස්ථානයේ පවත්නා උසස්වීම් අතර ලිංගික අනුග්‍රහයන් මත සිදුවන උසස්වීම් ද පවතී.

සේවය කරන ස්ත්‍රීන්ගෙන් වැඩි පිරිසක් අර්ධ නාගරික පෙදෙස්වල කාන්තාවන් වන අතර ඉන් අඩක් පමණ දිළිඳු පවුල්වලට අයත් වෙති. ශ්‍රමිකයන්ගේ ආහාරපාන හා පෝෂණය ද, අසතුටුදායක වේ. වෘත්තීය සමිති ක්‍රියාත්මක නොවීම, උසස් වීම් ගිලිහී යාම හා විවේකය ප්‍රමාණවත් නොවීම ආදී දෑ මගින් ශ්‍රමික අයිතීන් කප්පාදු වී ඇත. පුන පුනා කරන නිපැයුම් කාර්යයන් නිසා සාමාන්‍ය සෞඛ්‍ය තත්ත්වය අයහපත්වීම, ඇස් පෙනීම දුර්වල වීම ආදිය සිදු වේ. වෘත්තිමය රෝග-පීඩා හා වෙහෙස නිසා අවසානයේ රැකියාවක් කළ නොහැකි දුබල ශරීර ඇත්තන් බවට පත්වේ.

සේවා ස්ථානයේ සිදුවන විවිධ අකටයුතුකම් පිළිබඳ සත්‍ය තොරතුරු දැනගැනීමේ හා ප්‍රකාශනයේ අයිතිය ද මොවුනට ඇතැම්විට අහිමිය. සත්‍ය තොරතුරු දැන ගත්ත ද, සාධාරණ අයිතීන් වෙනුවෙන් හඬක් නැඟීම ද කළ නොහැක්කකි. එසේම රැකියාව තුළ සිදුවන්නා වූ විවිධ අකටයුතුකම් නිසා සේවයෙන් නෙරපා හැරීම, සේවයෙන් පහත දැමීම හා සේවක වරප්‍රසාද කප්පාදු කිරීම ආදිය සිදුවේ. හිංසාවෙන්, පීඩාවෙන් තොරව උපරිම අයුරින් පෞරුෂය වර්ධනය කරගැනීමේ හැකියාව ඉහළ නැංවීම සඳහා සේවා ස්ථානයෙන් උපරිම දායකත්වයක් ලබා දිය යුතු වූව ද, එවැනි දෑ සඳහා සෑම ආයතනයක්ම පහසුකම් සපයන අවස්ථා විරලය. බියෙන් සැකෙන් තොරව අයතනයේ රැඳී සිටීමේ හා ආයතනයට පැමිණීමේ දී ආරක්ෂාව තහවුරු කරගැනීම ද දුෂ්කර වී ඇත.

ජේසුස් වහන්සේගේ කාලයේ පලස්තීන සමාජයේ සිටි බහුතරය පීඩිත ජනතාව වූ අතර ඔවුන් ජීවත් වූයේ විශාල අරගලයකිනි. සමාජීය මෙන්ම ආගමික වශයෙන් ද ඔවුන්ව කොන් කර තිබිණි. කොන් කළ ජනතාව අතරින් වැඩිදෙනා යාචක, ගැමි, වැන්දඹු හා අනාථවූවන් හා පව්කාරයන් විය (දිසානායක, 13). වැන්දඹුවෝ බෙහෙවින් මෙම සමාජ ක්‍රමයේ අසරණ තත්ත්වයට පත්වූහ. වැන්දඹුවන් හා අනාථයන් අන් අයගේ ත්‍යාගශීලී භාවය මත යැපිණි. වැන්දඹුව සඳහා යෙදෙන හේබ්‍රව් අරුතින් අර්ථවත් වූයේ 'නිහඬ තැනැත්තිය හෝ කථා කිරිමට නොහැකි තැනැත්තිය' යන්නයි (දිසානායක, 13). මෙමගින් ඇයගේ අසරණ භාවයේ ප්‍රබලත්වය ඉස්මතු වේ. පුරුෂ මූලික සමාජයේ මොවුන් සූරාකෑමේ හා මර්දනයේ සංකේත බවට පත්විය. වෙළෙන්දන්, වඩුවන්, ධීවරයන් හා කර්මාන්තකරුවන් මධ්‍යම පංතියට අයත් වූ අතර ඉහළ පංතියට අයත් වූයේ සීමිත ජන කොටසකි (දිසානායක, 15). වංශවත් පවුල්වලින් හා රදල හිමියන්ගෙන් යුත් මොවුන් යටතේ නිෂ්පාදන මාධ්‍යයන්, වෙළෙඳාම් හා කර්මාන්ත පාලනය විය. මොවුහු වර්තමාන සුපිරි බලවතුන් මෙහෙයවන බහුජාතික සමාගම් මෙන් සුළු ජාතීන්ගේ ශ්‍රමය සූරා කන ආර්ථිකය පාලනය කළහ. විශාල ජන කොටසකගේ මානව උදාරත්වය අහිමිව තිබූ යුගයේ ජේසුස් වහන්සේ පව්කාරයන්, අයකැමියන් හා වෛශ්‍යාවන් වැනි ජුදා සමාජයෙන් කොන් කළ ජනතාව අතර ජීවත්වෙමින් ඔවුනට සුබාරංචිය දේශනා කළ සේක.

සියලුදෙනාට සමාන උදාරත්වයක් භුක්ති විඳීමේ අයිතිය අහිමි කළ ජුදා සමාජයේ බලවත්තු සියලු සමාජ වටිනාකම්වලට හිමිකම් කීහ. දුබලයෝ ෛෙතිවාසිකම් අහිමි වීමෙන් පීඩාවට පත්වූහ. දුබලයන් අතර කාන්තාවන් ප්‍රධාන විය. කාන්තාවෝ ජුදා සමාජයේ පොදු මානව උදාරත්වයක් අහිමි

දුබල ප්‍රජාව නියෝජනය කළහ. ඔවුනට අහිමි මානව උදාරත්වය හිමි කර දීමේ කර්තව්‍යයේ ප්‍රබල මානවවාදියකු වශයෙන් ක්‍රියා කිරීමට ජේසුතුමා සමත් විය. උන්වහන්සේගේ වෑයම වූයේ කාන්තා උදාරත්වය තහවුරු කර දීමයි. එතුමා කාන්තාවන්ට දේව රාජ්‍යය උරුම කරගත හැකි බව පෙන්වා දුන්නේ ය. ජේසුතුමාගේ සුබ අස්නට සවන් දීමටත්, එතුමාගේ විමුක්තියේ අත්දැකීමට හවුල් වීමටත්, සාක්ෂ්‍යකරුවන් වීමටත් එතුමා ඔවුන්ව කැඳවූවේය.

ඒ අනුව අතීත ජුදා සමාජයේ කාන්තාවට මානව විමුක්තියක් නොතිබූ බව මෙමගින් පැහැදිලි වේ. එහෙත් ක්‍රිස්තුස් වහන්සේගේ කාලයෙන් පසු කාන්තාවට සමාජයේ හිමි විය යුතු තත්ත්වය පිළිබඳ අදහස් ඉහළ නැංවීමට ක්‍රිස්තියානිය සුවිශාල පන්නරයක් ලබාදුන්නේය. ජේසුතුමා ජුදා සමාජයේ කාන්තාවට හිමිව තිබූ පීඩනය ඉවත් කොට සෑම අවස්ථාවකදීම අනුකම්පා සහගතව, විප්ලවකාරී බවින් යුතුව කාන්තාවගේ හා පුරුෂයාගේ සමාජ හැකියාවන් අවබෝධ කර ගත්තේය. එතුමා තම වදනින් කාන්තාවගේ අගය ද, සමාජයට ඇගෙන් ඉටුවන සේවාව ද මනා ලෙස හුවා දැක් වූ අතර පුරුෂයා හා සම අයිතිවාසිකම් ලැබීමට ඇයට ද හිමිකම් ඇති බව ස්වකීය ජීවිත සිදුවීම් මගින් මැනවින් පිළිබිඹු කළේය. නව ගිවිසුම තුළ ක්‍රිස්තුස් වහන්සේ හා කාන්තාව සම්බන්ධ සිදුවීම් ඔස්සේ අපට පෙනී යන්නේ මිනිස් බව කොතැන ද, එතැන්හි එතුමා මිනිසත් බව වෙනුවෙන් පෙනී සිටි බවයි. සමාජීය පුද්ගලයෙකු වශයෙන් ක්‍රිස්තුස් වහන්සේ හා කාන්තා පක්ෂය අතර තිබූ සබැඳියාව සාමාන්‍ය ජුදා සිරිත් ඉක්මවා යන්නක් වූ නිසා එකල ජුදා ආගමික නායකයන්ගේ දෝෂ දර්ශනයට පවා එතුමා පාත්‍ර විය.

ජුදා සමාජයේ කාන්තාවන්ට උදාරත්වය හිමි කර දීමට ජේසුතුමා මහත් පරිශ්‍රමයක් දැරුවේය. කාන්තාවකට රබ්බිවරයෙකුගේ ඉගැන්වීමට සවන් දීම හා ඔවුන්ගෙන් ඉගෙන ගැනීම තහනම් විය. එම අයිතිය හිමි වූයේ පුරුෂ පාර්ශවයට පමණි. එහෙත් ලූක් සුබාරංචියේ සඳහන් පරිදි මාර්තා හා මරියාගේ නිවසේ සුබාරංචි ඉගැන්වීම්වලට සවන් දෙමින් සිටි මරියාව ජේසුතුමා ප්‍රතික්ෂේප නොකළේය. ඇයගේ තෝරා ගැනීම උන්වහන්සේ අගය කළ සේක. සාම්ප්‍රදායික ජුදා නීති-රීති අභිභවා ගිය ඇයගේ ශ්‍රාවකත්වය ජේසුතුමාට වැදගත් විය.

ජුදා ආගමික නීතිය අනුව තමන් නොහඳුනන ගැහැණියක් සමග මිනිසෙක් ප්‍රසිද්ධියේ කතා නොකළ යුතු විය. මිනිසෙක් ගැහැණියක සමග සංවාදයක් දිග්ගැස්සෙන සෑම මොහොතකම ඔහු නීතියට පිටුපා වරදක් කරගන්නා බව පිළිගැනිණි (දිසානායක, 35). නමුත් ජේසුතුමා ප්‍රසිද්ධියේ කාන්තාවන් සමග කතා කළේය. ඔවුන්ගේ ප්‍රකාශන අයිතිය අහිමි කළ ජුදා නීති එතුමා අනුමත නොකළේය.

**යුතුකම් හා වගකීම්** - යුතුකම් හා වගකීම් සෑමවිටම මාපිය-දූදරු, අඹු-සැමි හා ස්වාමි-සේවක යනාදී සබඳතා සමග බැඳී පවතී. කාන්තාවන් වශයෙන් ඔවුනට වෘත්තීය ජීවිතය පමණක් නොව ගෘහස්ථ ජීවිතයේ සබඳතා සුරක්ෂිත කිරීමේ වගකීමක් ද, සමාජීය වශයෙන් පවතී. විවාහක කාන්තාවකට සිය ස්වාමියා හා දූදරුවන්ගේ කටයුතු ආදියේ ද, ගේ-දොර කටයුතු ආදියේ ද කළමනාකරණයක් පවත්වා ගැනීමට සිදුවේ. කාන්තාව වනාහි සියලු සමාජ වගකීම් කරපින්නා ගත් තැනැත්තියකි. ඇතැම් කාන්තාවන් රැකියා දිවිය නිසා පවුල් ජීවිත අසාර්ථක වීමෙන් හා දරුවන්ගේ නොමග යෑම් හමුවේ අසාර්ථක පවුල් ජීවිත ගත කරයි. තවද ජීවන බරින් පීඩිත වීම නිසා පවුලේ වගකීම් සියල්ල සියතට ගනිමින් වෘත්තීය දිවියේ වගකීම් හා පවුලේ වැඩකටයුතු ආදී සියලු වගකීම්වලින් බැඳී ඇත.

එබැවින් ස්වාමිවරුන් සිය ආයතන ශ්‍රමිකයන්ගේ නිදහස් මානසිකත්වය තහවුරු කිරීමට උත්සුක විය යුතුය; ශ්‍රමයට සරිලන වැටුප් ගෙවිය යුතුය; ශ්‍රමික අයිතින් හා වරප්‍රසාද තහවුරු කළ යුතු ය. එය ඔවුන්ගේ වගකීමකි. ශ්‍රමික පාර්ශවයෙන් ද, සිය වැටුපට සරිලන ලෙස සේවාවක් ඔවුන් ඉටු කළ යුතු වේ. ජුදා සමාජයේ ද කාන්තාව යුතුකම් හා වගකීම් සමූහයකින් වෙළී සිටියා වූ තැනැත්තියකි. එකල ජුදා සමාජයේ මෙන්ම වත්මන් පීතෘ මූලික සමාජ ක්‍රමයේ ද කාන්තාවට පැවරී ඇති යුතුකම් හා වගකීම් බොහෝවිට සමාන ව්‍යුහයකින් යුක්තය.

**ආගමික හා සමාජ පිළිගැනීම** - ඇඟලුම් ක්ෂේත්‍රයේ රැකියා නූතන සමාජ පිළිගැනීමෙන් තරමක් දුරස්ථව ඇති බව මෙම අධ්‍යයනයෙන් තහවුරු විය. මෙම වෘත්තියේ නියැලෙන කාන්තා ශ්‍රමිකයන් අඩු අධ්‍යාපන සුදුසුකම් සහිත ශ්‍රමිකයන් වීමත්, මොවුන් අතර බහුලව සිදුවන ලිංගික සූරාකෑම් නිසාත් පහළ මට්ටමේ සමාජ පිළිගැනීමක් මෙම ශ්‍රමිකයන්ට හිමිවී ඇත. ශ්‍රී ලාංකේය සංස්කෘතිය මොවුන් දෙස බලනුයේ සැකයෙන් හා උපහාසයෙනි. කෙසේවෙතත් මෙම කාන්තාවෝ රැකියා නියුක්තිය, විවාහය, පවුල් ජීවිතයේ ශුභසිද්ධිය ගැන බියෙන් හා චකිතයෙන් පිරුණු ජීවිත ගත කරති.

ක්‍රිස්තුන් වහන්සේ විසූ සමයේ ද, වෘත්තිය පදනම් කරගෙන බොහෝ දෙනෙක් පහත් කොට සැලකිණි. වෛශ්‍යා වෘත්තිය, සොරකම, පොලී මුදල් දීම, සූදු කෙළීම හා අයබදු එකතු කිරීම යන වෘත්තීන් පාපිෂ්ඨ වෘත්තීන් වශයෙන් සැලකිණි. පාපිෂ්ඨ වෘත්තීන්හි නියුක්ත ජනයා පව්කාරයන් ලෙස හංවඩු ගැසිණි. මූලික මිනිස් අවශ්‍යතා සපුරා ගැනීමට නොහැකි වීමෙන් දුගීන් කෙතරම් පීඩාවට පත්වුව ද ඔවුන් විඳි දරුණුම පීඩාව වූයේ ලැජ්ජාව හා අපහාසයයි. එකල මධ්‍යධරණී සංස්කෘතියක් තුළ පොදුවේ ගෞරවය උසස් වටිනාකමක් වශයෙන් මුල් බැසගෙන තිබූ වකවානුවක ප්‍රතික්ෂෙප කරනු ලැබූ හා කොන් වූ අය වශයෙන් සැලකීම දරුණු සමාජ පීඩාවක් විය. ස්ථිර රැකියාවක් නොමැතිව කල් ගෙවූ දිළිඳු ජනයාට තම රැකියාව සඳහා නිසි වේතනයක් නොලද සමයේ ජේසුතුමා කම්කරු ශ්‍රමය සූරා කෑ ධනපතියන් විවේචනය කළේය. 'ධනවතෙක් දෙවියන් වහන්සේගේ රාජ්‍යයට ඇතුළු වීමට වඩා ඔටුවෙකු ඉඳිකටු මලින් රිංගා යාම පහසු ය' යැයි ජේසුතුමා පවසා සිටියේ ද සදාතන ජීවිතය ලබා ගැනීමට ධනවතුන්ට සිය ධනය බාධාවක් වී ඇති බව පෙන්වා දීමටය (ලූක් 18:24-25). මෙලෙස ජුදා ආගමික හා සමාජ ව්‍යුහ ප්‍රතික්ෂේපයට ලක් කළ ජනතාව ජේසුතුමාගේ පිළිගැනීමට පාත්‍ර වූහ.

**ප්‍රේමය** - සමාජ සහසබඳතා පැවැත්වීමේ දී පරිත්‍යාගය, අන් අයට ප්‍රේම කිරීම ආදී ගුණ ධර්ම අවශ්‍ය වේ. ඇඟලුම් ක්ෂේත්‍රයේ කාන්තාවන් බොහෝවිට සමාජ පිළිගැනීම නොමැති වීමෙන් කොන්වී පීඩාවට පත්වූ අවස්ථා කොතෙකුත් ඇත. ආයතනයේ බලපෑම් හා විවිධාකාර පීඩා මතින් ජීවන වෘත්තියේ නියැලෙන මොවුනට සමාජයේ ආදරය හා දයානුකම්පාව අවශ්‍යව පවතී. ජේසුතුමා එකල ජුදා සමාජයේ යහපත් - අයහපත්, දුප්පත්-පොහොසත්, ගැහැණු-පිරිමි භේදයකින් තොරව සියලුදෙනාටම එක සේ ප්‍රේම කළේය. මේ අතරෙන් සමාජයේ පීඩිත, කොන්වූ හා අසරණ ජනතාව වෙත උන්වහන්සේගේ සුවිශේෂ අවධානයක් යොමු විය. ඔවුනට විශේෂාකාරයෙන් උන්වහන්සේගේ ප්‍රේමය පතිත විය.

මෙලෙස නිදහස අහිමි වීම, සමානාත්මතාව ගිලීහී යාම, සමාජ අයිතීන් අහිමි වීම, සමාජ යුතුකම් හා වගකීම්, ආගමික හා සමාජ පිළිගැනීම හා ප්‍රේමය නොලැබී යාමේ තත්ත්ව වර්තමානයේ මෙන්ම තත්කාලීන බයිබලීය සමාජ පසුබිමෙහි ද දක්නට ලැබෙන බව ඉහත සංසන්දනයේ දී

විද්‍යාමාන විය. එසේ නම් උදාරත්වය නම් සංකල්පයේ පොදු ව්‍යුහයක් පවතින බව පෙනී යයි. එනම් කාන්තා උදාරත්වය යන්න විවිධ කාලයන්හි විවිධ ලෙසින් අරුත් ගැන්වුව ද, උදාරත්වයක් හිමි වීම සඳහා කවර සමාජයක වුව ද පොදු මානුෂීය ගුණාංග තහවුරු කළ හැකි වාතාවරණයක් පවතී ද එතැන්හි උදාරත්වය අත්දැකිය හැකිවේ.

කාන්තා උදාරත්වයේ පොදු මානුෂීය ව්‍යුහය අහිමිව ගිය සමාජයක ජේසුතුමා ක්‍රියාත්මක වූයේ කෙසේදැයි මෙම සංසන්දනයේ දී ගම්‍ය විය. එතුමා එකල ජුදා සමාජයේ පැවති පීඩිත ව්‍යුහය කිසිවිටෙකත් අනුමත නොකළේය. උත්තරීතර මනුෂ්‍යත්වයේ ක්‍රියාකලාපය විය යුත්තේ පීඩිත ව්‍යුහවලින් පීඩිතයන් හට විමුක්තිය අත්කර දීම සඳහා ජේසුතුමා දැක්වූ උනන්දුවයි. එසේනම් මානව හිතවාදී පුද්ගලයෙක් වශයෙන් එතුමා ක්‍රියාත්මක කළ ප්‍රතිපදාව අනුගමනය කිරීම හා එම ප්‍රතිපදාව වර්තමාන ජීවන අරගල හමුවේ අදාල කරගැනීම සිදුවිය යුත්තකි.

එවිට ජේසුතුමා තත්කාලීන ජුදා සමාජයේ කාන්තාවට හිමිව පැවති අඩු ගරුත්වයෙන් හෙබි ආගමික, දේශපාලනික, සමාජීය හා සංස්කෘතික ව්‍යුහ ප්‍රතිසංස්කරණය කිරීමට ලබා දුන් ආලෝකය වත්මන් සමාජ ගැටලු සඳහා අදාළ කරගනිමින් ඒවාට ප්‍රායෝගික අරුතක් එක් කළ හැකිවේ.

## සමාලෝචනය

ලංකාවේ විවිධ වාර්ගික කණ්ඩායම්වලට අයත් ඇතැම් සාහිත්‍යවල හා ආගමික සාහිත්‍යයේ ද කාන්තාව පිළිබඳ වූයේ නිෂේධාත්මක චිත්ත රූපයකි (පෙරේරා, 16). කාන්තාව පිළිබඳ වූ එම නිෂේධාත්මක චිත්ත රූපය බටහිර අධිරාජ්‍යවාදී බලපෑමෙන් දිවයිනේ සිදුවූ ආර්ථික, සමාජීය හා සංස්කෘතික විපර්යාස සමග තරමක් වෙනස් මුහුණුවරක් ගත්තේය. එහිදී කාන්තාවගේ සාම්ප්‍රදායික අයිතීන් වෙනුවට බටහිර කාර්මික ධනපතිවාදය ඇති කිරීමෙන් ලාභ-ශ්‍රම ඒකක වශයෙන් කාන්තා නිපුණතා භාවිතයට ගැනීමක් සිදුවිය. තවද අධ්‍යාපනයට හා රැකියාවලට ඉඩ ප්‍රස්ථා ලබා දීමෙන් කාන්තාවගේ විෂය ක්ෂේත්‍රය පුළුල් වීමක් සිදුවිය.

ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධන ප්‍රතිපත්ති අතර 1977 රජය විසින් ක්‍රියාත්මක කළ ආයෝජන කලාපයන් සඳහා ප්‍රමුඛස්ථානයක් හිමි විය. විවෘත ආර්ථිකයේ බල ගැන්වීමෙන් මෙම ආයෝජන කලාපයන්ට පරිබාහිරව පසුකාලීනව ප්‍රාදේශීය ඇඟලුම් කර්මාන්තශාලා ද විවෘත වූ අතර මෙම කුඩා පරිමාණ ඇඟලුම් ආයතන දිවයින පුරා විවිධ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල නිරීක්ෂණය කළ හැකි වේ. මේ අතරින් කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ද මහා පරිමාණ ඇඟලුම් ආයතන සුලබව දක්නට ඇත. එම ප්‍රදේශයේ කාන්තා ශ්‍රමිකයන් මෙන්ම ගම්බද පෙදෙස්වල සිට පැමිණෙන කාන්තා ශ්‍රමිකයෝ විශාල වශයෙන් මෙම රැකියා ආයතන සඳහා අඛණ්ඩව ආකර්ෂණය වෙමින් සිටිති.

මෙවැනි සන්දර්භයක මෙම පර්යේෂණයෙන් ලූක් සුබාරංචියට අනුව ජේසුස් වහන්සේ තත්කාලීන ජුදා සමාජයේ කාන්තාවට හිමි කර දුන් උදාරත්වය හා ඇඟලුම් ක්ෂේත්‍රයේ නියුක්ත වර්තමාන කාන්තා ශ්‍රමිකයන්ගේ උදාරත්වය අතර පවතින සමාන-අසමානතා තුලනාත්මක අධ්‍යයනය කරන්නට සමත් විය. එසේ අධ්‍යයනයෙන් කාන්තාව පිළිබඳ ජුදා සමාජයේ පැවති හා වර්තමාන සමාජයේ පවතින සමාජ, සංස්කෘතික ආකල්පවල විෂමතා හා ආර්ථික ක්ෂේත්‍රයේ සිදුවන අක්‍රමිතා හඳුනා ගැනීමට හැකි විය. එම අක්‍රමිකතා මගහරවා ගැනීමට ලූක් සුබාරංචි චින්තනයේ නිරූපිත

ජේසුතුමා ක්‍රියා කළ ආකාරය වත්මන් සමාජ ව්‍යුහ ප්‍රතිසංස්කරණයට යොදා ගත හැකි වන්නේ කෙසේදැයි අනාවරණය විය.

## නිගමනය

මනුෂ්‍යයෙකු වශයෙන් සෑම පුද්ගලයෙකුටම හිමිවිය යුතු ගරුත්වය විවිධ ලෙසින්, විවිධ කාලයන්හි අර්ථකථනය කළ ද, ඒ සියල්ලේම අන්තර්ගත වන්නේ පොදු මානුෂීය ගුණධර්මයන්ගේ සුරක්ෂිත වීමකි. එසේම කවර සමාජයක වුවද පීඩිත බවේ බාහිර මුහුණුවර වර්තමානයේ වෙනස් වී ඇතත් පීඩිත ව්‍යුහ සමාන වේ. එනම් පීඩිත ව්‍යුහ තත්ත්කාලීන ජුදා සමාජයේ මෙන් ම වත්මන් සමාජයේ ද තවදුරටත් ක්‍රියාත්මක වේ. එවැනි සන්දර්භයක පීඩිත ව්‍යුහ අතික්‍රමණය කිරීමට මනුෂ්‍යයෙකු සතු විය යුතු පොදු මානුෂීය වටිනාකම් සර්වකාලීන වැදගත්කමකින් යුක්තය. පොදු මානුෂීය ව්‍යුහ (නිදහස, සමානාත්මතාව, අයිතීන් හිමිවීම, ප්‍රේමය හා සමාජ පිළිගැනීම යනාදිය) සුරක්ෂිත වූ කල්හි පීඩකයන්ට එම සමාජ ව්‍යුහයේ තවදුරටත් පැවැත්මක් නොමැත. එහෙයින් පීඩකයාට මෙන්ම පීඩිතයාට ද විමුක්තිය ළඟා කර ගත හැකිවේ.

පීඩිතයාව පීඩාවට පත් කරන්නා වූ සාම්ප්‍රදායික යටත්විජිත මානසිකත්වයෙන් මිදී පොදු මිනිස් පවුලක් වශයෙන් දිවි ගෙවීම සඳහා දුබලයාගේ පැත්ත ගත යුතු වේ. කාන්තා උදාරත්වය පිළිබඳ ලූක් සුබාරංචි චින්තනයෙන් පිළිබිඹු වූයේ ජේසුතුමා එකල පිතෘ මූලික සමාජයේ දුබලයා වූ කාන්තාවගේ පැත්ත ගැනීමේ යථාර්ථයයි. වත්මන් සමාජය ද, ඇඟලුම් ක්ෂේත්‍ර ප්‍රධානීන් යටතේ දුබලයන් වී සිටින ශ්‍රමිකයන්ගේ පැත්ත ගන්නේ නම් ගිලිහී යමින් පවතින පොදු මානුෂීය වටිනාකම් යළි ස්ථාපිත කළ හැකි වේ. එවිට කාන්තා උදාරත්වය තහවුරු කළ හැකි වන්නා සේම සියල්ලන්ටම තම ජීවිත අරමුණු කරා ද ළඟා විය හැකිවේ.

## මූලාශ්‍රයයන්


- Balasuriya, Tissa. *Mary and Human Liberation*. Center for Society and Religion, 1997.
- Bewley, R. *The Life of Jesus*. Lion Hudson, 2005.
- Brown, R. *An Introduction to the New Testament.* Yale U, 1997.
- Brown, Raymond E, Joseph A. Fitzmyer, et al. *The New Jerome Biblical Commentary.* TPI, 2007.
- Clemp L, B.Reddies. *Women Textile Workers Demand Justice:* On the Situation of the Garment Industry in the Countries of the South. Friedrich Ebert Foundation, 1992.
- Derickx, H. *A key to the Gospel of Luke*. Claretian, 2000.
- Derickx, H. *The Passion Narratives of the Synoptic Gospels*. East Asian Pastrol Institute, 1977.

- Devanarayana, C. *A Review of Free Trade Zones in Sri Lanka*. Katunayake, 1997.
- Hendrickx, H. *The Infancy Narratives*. East Asian Pastoral Institute, 1975.
- Hendrickx, H. *The Passion Narratives*. East Asian Pastoral Institute, 1977.
- Hornby, A.S. *Oxford Advanced Learner's Dictionary of Current English.* Oxford UP, 2010.
- Knox, R. *A Commentry on the Gospels.* Sheed & Ward, 1952.
- Marshall, H. *The Gospel of Luke*: A commentary on the Greek Text. William B. Eerdmans, 1995.
- Peterson, R. D. *A Concise History of Christianity*. Wadsworth, 1999.
- Timothy, L. *The Gospel of Luke*. A Michael Glazier, 1991.
- Wijngaards, J.N.M. *Background to the Gospels*. Theological Seminary, 1978.
- කුමාර එන්.වී.ජී.ඒ.එච්. *ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා කාන්තා ‍ඓතිවාසිකම්.* විජේසූරිය, 2009.
- ජයසේන, බී. *කාර්මික සුරක්ෂිතතාව.* සමයවර්ධන, 2005.
- පීරිස්, ඇලොයිසියස්. "ක්ෂමාවෙන් තොර අනාගතයක් නොමැත". *විමුක්ති ගතික කිතුනු ඇසින්*, සංස්. විජිත් රොහාන්, කොළඹ, 2011, 50-56.
- පෙරේරා, කේ.ජේ. *කාන්තා ප්‍රතිරූපය හා සමාජ මුහුණුවර.* අභය, 1993.
- පෙරේරා, එස්. *මැකෙන මතක.* කටුනායක, 2007.
- දිසානායක, එච්. *නාසරතයේ ජේසු.* සමාජය හා සාමයික කේන්ද්‍රය, 2000.
- වැල්ලවත්ත, ජේ. "ගමෙන් නගරයට ගමෙන් යළි නගරයට". *විනිවිද*, 2002, 170-197.
- විජේතුංග, පී. "නිදහස් වෙළෙඳ කලාපය ගැන දේවධාර්මික විමසීමක්". *විමුක්ති ගතික කිතුනු ඇසින්,* සංස්. විජිත් රොහාන්, කොළඹ, 2011, 203-212.
- විජේසිංහ, එස්.එල්. *බයිබලය අධ්‍යයනයට අත්වැලක්.* සමාජය හා සාමයික කේන්ද්‍රය, 2008.
- විජේසිංහ, එස්.එල්. *දිවැසිවරු හා සාධාරණත්වය* සමාජය හා සාමයික කේන්ද්‍රය, 2002.
- දමයන්ති, එම්.බී.ආර්. "නිදහස් වෙළෙඳ කලාපීය සේවිකාවන් පිළිබඳ අධ්‍යයනයක්". නිවේදිනි, 6 වෙළුම, 1 කලාපය, 1999, 38-78.
- ද සිල්වා, බී. "නිදහස් වෙළෙඳ කලාපයේ කාන්තාවන්ගේ ද්විතියික

සමාජානුයෝජනය හා නව අවශ්‍යතා ගොඩනැගීම". *නිවේදිනි,* 13 වෙළුම, 2 කලාපය, 2006, 97-114.

- "මිල,වැටුප්,සේවා නියුක්තිය හා ඵලදායිතාව" http://www.cbsl.gov.lk/pics_n_docs/10_pub/_docs/efr/annual_report/AR2016/Sinhala/8_Chapter_04.pdf pg.140 [උපුටා ගැනීම 2017 දෙසැම්බර් 2]